# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,130 - 2019 ජූනි මස 28 වැනි සිකුරාදා - 2019.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 396 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 400 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 ජූලි මස 19 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජූලි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

ඩී. එෆ්. සී. සී බැන්ක්,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

........................*පැමිණිලිකරු.*

නඩු අංකය ඃ CHC/97/2013 MR.

*එදිරිව*

1. ඩයිනග්‍රෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ්
අංක 549 බී, ඉසුරු උයන,
ඩී. පී. විජේසිංහ මාවතට ඔබ්බෙන්,
තලංගම දකුණ, බත්තරමුල්ල.

2. ටර්බයින් වෙන්ටිලේෂන් සිස්ටම්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
අංක 549 බී, ඉසුරු උයන,
ඩී. පී. විජේසිංහ මාවතට ඔබ්බෙන්,
තලංගම දකුණ, බත්තරමුල්ල.

..........................*විත්තිකරුවන්.*

ඉහත සඳහන් 1 වන සහ 2 වන විත්තිකරුවන් වෙත ය.

මෙම නඩුවේ 2018 ක් වූ මැයි 16 වැනි දින ඇතුලත් කර ඇති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ ආයාචනයේ ඇයද ඇති පරිදි මෙම නඩුවේ විත්තිකරුවන්ට විරුද්ධව,

*1 වන නඩු නිමිත්ත වශයෙන්*

එකී ශ්‍රී ලංකා රුපියල් 4,037,265.43 මුදලක් ද මුල් මුදල වශයෙන් රුපියල් 3,000,000 ක මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එම මුල් මුදල මත 2012 මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29%ක අනුපාතය මත පොලිය ද,

*2 වන නඩු නිමිත්ත වශයෙන්*

එකී ශ්‍රී ලංකා රුපියල් 4,037,265.43 මුදලක් ද මුල් මුදල වශයෙන් රුපියල් 3,000,000 ක මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එම මුල් මුදල මත 2012 මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29% ක අනුපාතය මත පොලිය ද,

*3 වන නඩු නිමිත්ත වශයෙන්*

එකී ශ්‍රී ලංකා රුපියල් 3,312,686.15 මුදලක්ද මුල් මුදල වශයෙන් රුපියල් 2,449,639.44 ක මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එම මුල් මුදල මත 2012 මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29% ක අනුපාතය මත පොලිය ද,

*4 වන නඩු නිමිත්ත වශයෙන්*

එකී ශ්‍රී ලංකා රුපියල් 4,037,265.43 මුදලක්ද මුල් මුදල වශයෙන් රුපියල් 3,000,000 ක මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එම මුල් මුදල මත 2012 මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29% ක අනුපාතය මත පොලිය ද,

*5 වන නඩු නිමිත්ත වශයෙන්*

එකී ශ්‍රී ලංකා රුපියල් 4,037,265.43 මුදලක්ද මුල් මුදල වශයෙන් රුපියල් 3,000,000 ක මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එම මුල් මුදල මත 2012 මාර්තු මස 01 වැනි දින සිට වාර්ෂිකව 29% ක අනුපාතය සහ පොලියද ඇතුලත්ව අයකර ගැනීමට විත්තිකරුවන්ට එරෙහිව නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ඇතුලත් කර ඇති හෙයින් ද එලෙස තීන්දු කරන ලද තීන්දුව අනුව විත්තිකරුවන් විසින් ගෙවීම් පැහැර ඇති බැවින් එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර මෙහි පහත උපලේඛනයේ මැනවින් විස්තර කර ඇති ඉඩම හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියළු දේ 2019 ක් වූ ජූලි මස 25 වන දින ප.ව. 2.00 ට එම දේපල පිහිටා ඇති බස්නාහිර පළාතේ

කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභාවේ බත්තරමුල්ල - තලංගම ඒකකයේ සීමාව ඇතුළත වරිපනම් අංක 549/බී (ඉසුරු උයන) එකී දේපල පිහිටා ඇති ස්ථානයේදී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25% මුදලක් ද,
2. තක්සේරු ගාස්තුව වන 0.5% ක් ද,
3. වෙන්දේසිය *ගැසට්* කිරීමේ ගාස්තු,
4. පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද වියදම් ද,
5. අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් ද,
6. පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතු 01% ක ගාස්තුව ද,
7. රජයේ පවුන්ඩේජ් ගාස්තු ද,

විකිණීම අවසන්වූ වහාම ගැණුම්කරු විසින් මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30 ක් ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

## උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභාවේ බත්තරමුල්ල - තලංගම ඒකකයේ සීමාව ඇතුළත තලංගම දකුණ පිහිටි මිල්ලගහවත්තෝවිට හෝ අලුබෝගහලන්ද යනුවෙන් හඳුන්වනු ලබන වරිපනම් අංක 549/බී (ඉසුරු උයන) දරන (බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද වර්ෂ 1967 ක් වූ අගෝස්තු මස 20 වන දිනැති අංක 3625 දරන නැවත බෙදා වෙන් කිරීමක් වන පිඹුරේ ලොට් 13) බලයලත් මිනින්දෝරු සහ තලමිතිකරු අයි. ඒ. සී. සේනාරත්න විසින් සාදන ලද වර්ෂ 1989 ක් වූ ජනවාරි මස 20 වන දිනැති අංක 3440 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් සලකුණු කර නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : බලයලත් මිනින්දෝරු එම්. බී. ද සිල්වා විසින් සාදන ලද වර්ෂ 1918 ක් වූ පෙබරවාරි මස 11 වන දිනැති අංක 232 දරන පිඹුරේ ලොට් සී කැබැල්ල ද, නැගෙනහිරට ඉසුරු උයන වරිපනම් අංක 253/36 දරන පරිශ්‍රය ද, දකුණට ඉසුරු උයන සහ බස්නාහිරට එකී අංක 3625 දරන පිඹුරේ ලොට් 14 දරන කැබැල්ල ද වන ඉහත සඳහන් අංක 3440 දරන පිඹුර ප්‍රකාරව එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ පළතුරු පස සහ සියලු දේ සමඟ ප්‍රමාණයෙන් පර්චස් දහ නවයකුත් දශම අටයි හතක් (අ. 0. රූ. 0, පර්. 19.87) වන හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී. 1171/244 හි ලියාපදිංචි කර ඇති ඉඩම.

අශ්වයන් හරකුන් හෝ වෙනත් සතුන් ඇතිව හෝ නැතිව, මෝටර් කාර් මෝටර් ලොරි බර පැටවූ හෝ නොපැටවූ වෙනත් සෑම වර්ගයකම වාහන ඇතිව හෝ නැතිව මෙහි විශේෂයෙන්ම විස්තර කරන ලද මාර්ගය තුළ හෝ ඔස්සේ හෝ ඒ මත්තෙන් මින්පසු සදාකල්හිම කවර ස්වභාවයක වුව සියලුම කාරණාවන් සඳහා තමන්ගේ කැමැත්ත සහ අභිලාෂය පරිදි දිවා කාලයෙහි දී හෝ රාත්‍රී කාලයෙහි දී පයින් හෝ වෙනත් ලෙසකින් යාමට ඒමට පසු කිරීමට නැවත පසු කිරීමට උකස් දීමනාකරුට ඔහුගේ ආගන්තුකයන්ට ඉංජිනේරුවන්ට වාස්තු විද්‍යාඥයන්ට ශ්‍රමිකයන්ට සේවකයන්ට කුලී නිවැසියන්ට බලපත්‍රලාභීන්ට සහ ආරාධිතයන්ට ආයතනයේ නිර්යාතයේ ප්‍රතික්‍රමණයේ පූර්ණ සහ නිදහස් අයිතිය ස්වාධීනතාව සහ අවසරය ද ඒ සමග දරන පාවිච්චි කරනු ලබන භුක්ති විඳින සියලු සහ ඒ ඒ අයිතීන් මං, වාසි සහ අනුබද්ධයන් ද ඒ මත හෝ උඩින් විදුලි කේබල් සහ උඩින් කම්බි සහ ජලාපවහන ගෑස් සහ ජලනල සහ කවර ස්වභාවයක වුව ගෘහෝපකරණ හෝ වෙනත් උපක්‍රම ද යෙදීමේ පූර්ණ සහ නිදහසේ සදාකාලීන අයිතිය සහ ස්වාධීනතාව.

ඉහත කී තලංගම පිහිටි මිල්ලගහවත්තඹිවිට *නොහොත්* අලුබෝගහලන්ද නමැති එකී ඉඩමට අදාලව බලපත්‍රලත් මිනින්දෝරු සහ තලමිතිකරු වී. ඒ. එල්. සේනාරත්න විසින් පිළියෙල කරන ලද වර්ෂ 1967 ක් වූ අගෝස්තු මස 20 වන දිනැති සහ අංක 3625 දරන එකී පිඹුරේ අඩි විස්සක පළල මාර්ග රක්ෂිතය වූ ද එකී පිඹුරේ ආර් 1 වශයෙන් නිරූපිත ඉඩම් කොටස වූ ද, අඩි 20 ක් පළල ඉසුරු උයන නමැති මුලු මාර්ගයට මායිම් උතුරට : 1, 6, ආර්. 2, 7,8, 11 ආර්. 4, 12 - 17 දරන ඉඩම් කොටස් නැගෙනහිරට : මාර්ගය, දකුණට 18 සිට 23 දක්වා ද, 24, ආර් 3, 27, 28, 30 දරන ඉඩම් කොටස් ද, බස්නාහිරට : බී දරන ඉඩම් කොටස සහ ප්‍රමාණයෙන් අංක 3625 දරන එකී පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 1, පර්. 20) ද හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 1178/191 හි ලියාපදිංචි වූ ද එකී මාර්ගය.

බී. ජේ. ගිලානි ද සිල්වා,
අධිකරණ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු (මුළු දිවයිනටම).

වාණිජ මහාධිකරණය, කොළඹ 12.
2019 ක් වූ ජුනි මස 13 වැනි දින දී ය.

06-845

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දී පැවැත්වෙන සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී,
අංක. 73/5, ගාලු පාර, කොළඹ 03.

*.....................පැමිණිලිකරු.*

නඩු අංකය ඃ CHC/202/2014 MR

*එදිරිව*

රුවිණි ලලන්ති ගලබොඩ,
150, අගලවත්ත පාර,
බදුරලිය.

(නැසීගිය යස්වන්ත් ලක්දීස් ගලබොඩගේ බූදලයට අදාල මතුගම දිසා අධිකරණයේ අංක. 05/2010 ටී දරන නඩුවේ දී යථා පරිදි පත්කරන ලද අද්මිනිස්ත්‍රාසිකාරිය)

*..........................විත්තිකාරිය.*

ඉහත නම් සඳහන් විත්තිකාරිය වෙත ය.

වර්ෂ 2017 ක් වූ නොවැම්බර් මස 14 වන දින මෙම නඩුවට ඇතුලත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුමත වී ඇති හෙයින්ද එම සමථ තීන්දු ප්‍රකාශය අනුව,

විත්තිකාරිය නියෝජනය කරන නැසීගිය වයි. එල්. ගලබොඩගේ බූදලයට විරුද්ධව රු. 7,645,404.51 ක් ද, හිඟ හිටවා ඇති මුල් මුදල වූ රු. 4,179,590.38 ක් ද මත 2013 ඔක්තෝබර් 01 වැනි දා සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වාත්, ඉනික්බිතව මුළු මුදල ගෙවා බේරුම් කරන තුරු තීන්දු ප්‍රකාශයේ මුදල මත වාර්ෂිකව 13% ක අනුපාතය අනුව වැඩිමනත් පොලිය ද, පැමිණිල්ල සමග ගොනු කර ඇති 'ඒ2'' දරන උකස් බැඳුම්කරය බලාත්මක කරමින් නියෝගයක් සඳහාත්, ''ඒ2'' දරන උකස් බැඳුම්කරය මත නැසීගිය වයි. එල්. ගලබොඩගේ බූදලයෙන් අයවිය යුතු රු. 6,765,915.21 ක මුදලක්ද, රු. 3,715,191.45 ක් වන හිඟ හිටවා ඇති මුල් මුදල මත 2013 ඔක්තෝබර් 01 වන දින සිට වාර්ෂිකව 13% ක අනුපාතය මත පොලිය ද ගෙවීම සඳහා මෙහි පළමුවන උපලේඛනයේ වඩාත් පූර්ණ වශයෙන් විස්තර කොට ඇති දේපල බන්ධිතව ඇති බවට හා ඇස්කිසි කළ හැකි බවට නියොග කොට ඇති හෙයින්ද,

''ඒ2'' දරන උකස් බැඳුම්කරය මත නැසීගිය වයි. එල්. ගලබොඩගේ බූදලයෙන් අයවිය යුතු රු. 6,795,915.21 ක මුදල සහ රු. 3,715,191.45 ක් වන හිඟ සිටවා ඇති මුල් මුදල මත 2013 ඔක්තෝබර් 01 වන දින සිට වාර්ෂිකව 13% ක අනුපාතය මත වැඩිමනක් පොලිය වෙනුවෙනුත් තීන්දු ප්‍රකාශයේ දින සිට මාස 02 ක් ඇතුළත මුදල් ගෙවන ලෙස නැසීගිය වයි. එල්. ගලබොඩගේ බූදලය නියෝජනය කරන විත්තිකාරියට කෙරෙන නියෝගයක් සඳහාත්, එම ගෙවීම පැහැර හැරියහොත්, මෙහි පළමුවන උපලේඛනයෙහි වඩාත් පූර්ණ වශයෙන් විස්තර කොට දක්වා ඇති දේපල අධිකරණය විසින් පත්කෙරෙන හා වෙන්දේසියේ කොන්දේසි මත බලපත්‍රලත් වෙන්දේසිකරුවෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට නියෝග කරමින් ආඥාකොට තීන්දු ප්‍රකාශ කොට ඇති හෙයින් ද,

''ඒ3'' දරන උකස් බැඳුම්කරය මත නැසීගිය වයි. එල්. ගලබොඩගේ බූදලයෙන් අයවිය යුතු රු. 849,489.40 ක් වූ මුදල ද රු. 464,398.93 ක් හිඟ හිටවා ඇති මුල් මුදල මත 2013 ඔක්තෝබර් 01 වන දින සිට වාර්ෂිකව 13% ක අනුපාතය මත වූ වැඩිමනක් පොලිය ද ගෙවීම සඳහා ''ඒ3'' දරන උකස් බැඳුම්කරය බලාත්මක කිරීම සඳහා සහ මෙහි 2 වන උපලේඛනයේ වඩාත් පූර්ණ වශයෙන් විස්තර කොට ඇති දේපල ඉහත කී මුල් ගෙවීම සඳහා බන්ධිතව ඇති බවට හා ඒවා ඇස්කිසි කළ හැකි බවට නියෝගයක් කරමින් තීන්දු ප්‍රකාශයක් ඇතුලත් කරනු ලැබ ඇති හෙයින් ද, ලෙස තීන්දු කරන ලද තීන්දුව අනුව විත්තිකාරිය විසින් ගෙවීම් පැහැර ඇති හෙයින් ද එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ ආඥාව ප්‍රකාර මෙහි පහත උපලේඛනයේ මැනවින් විස්තර කර ඇති ඉඩම හා ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ ආදී සියළු දේ,

වර්ෂ 2019 ක් වූ ජුලි මස 31 වන දින ප.ව. 2.00 ට එකී දේපල පිහිටා ඇති බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරලේ නැගෙනහිර මහපත්තු උතුරේ අගලවත්ත ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුලත එකී දේපල පිහිටා ඇති ස්ථානයේ දී,

ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25% මුදලක් ද,
2. තක්සේරු ගාස්තුව වන 0.5% ක් ද,
3. වෙන්දේසිය ගැසට් කිරීමේ ගාස්තු,
4. පුවත්පත් දැන්වීම් සඳහා දරන ලද වියදම් ද,
5. අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් ද,
6. පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතු 01% ක ගාස්තුව ද,
7. රජයේ පවුන්ඩේජ් ගාස්තු ද,

විකිණීම අවසන් වූ වහාම 25% මුදල ගැණුම්කරු විසින් මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30 ක් ඇතුළත කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරලේ නැගෙනහිර මහපත්තු උතුරේ අගලවත්ත ප්‍රාදේශීය බල සීමාව ඇතුළත උඩවෙල පිහිටි රිලවලතැන්න, ඇල්වත්ත, ගොඩඅරඹපිටකට්ටිය හෙවත් මෙගලේගොඩ සහ තඹගොඩකන්ද සහ හැව්ලොක් එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. වික්‍රමගේ විසින් මැන සකස් කරන ලද 2006 අප්‍රේල් මස 20 දිනැති අංක 2649 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම් උතුරට මු. පි. අංක 18573 හි ලොට් 3 සහ ලොට් 2 ද, නැගෙනහිරට : ලොට් 2 ද, දකුණට : ලොට් 2 ද සහ බස්නාහිරටඃ මු. පි. අංක 18573 හි ලොට් 3 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් හතරයි දශම නවයක් (අ. 0 රූ. 0, පර්. 34.9) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේ ද සමග වේ.

   එකී අංක 2649 දරන පිඹුරේ ලොට් 1, පහත විස්තර කොට ඇති අංක 951/එල්ආර්සී/ක/167 දරන පිඹුරේ ලොට් 1 හි නැවත මැනීමකි.

   ඉහත කී උඩවෙල පිහිටි රිලවලතැන්න, ඇල්ලවත්ත, ගොඩඅරඹපිටකට්ටිය හෙවත් බෙලිගලේගොඩ සහ තඹගොඩකන්ද සහ හැව්ලොක් එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට මතුගම බලයලත් මිනින්දෝරු එන්. කුලරත්න විසින් මැන සකස් කරන ලද 1983 සැප්තැම්බර් මස 16 සිට දෙසැම්බර් මස 23 දිනැති අංක 951/එල්ආර්සී/ක/167 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : එම්. පී. අගෝස් සිංඤෝ හිමිකම් කියන කන්දකොටුව ද, නැගෙනහිරට : එම්. ඒ. අගෝස් සිංඤෝ හිමිකම් කියන කන්දකොටුව ද, දකුණට : ඉහත කී අංක 951 පිඹුරේ ලොට් 2 ද සහ බස්නාහිරට : එම්. ඒ. අගෝස් සිංඤෝ හිමිකම් කියන කන්දකොටුව ද වශයෙන් මායිම් වූ එකී අංක 951/එල්ආර්සී/ක/167 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් තිස් හතරයි දශම නවයක් (අ. 0, රූ.0, පර්. 34.9) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේ ද සමග වේ. මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ241/244 හි ලියාපදිංචි වී ඇත.

2. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පස්දුන් කෝරලේ නැගෙනහිර මහපත්තු උතුරේ අගලවත්ත ප්‍රාදේශීය සභා බල සීමාව ඇතුළත උඩවෙල පිහිටි රිලවලතැන්න, ඇල්ලවත්ත, ගොඩඅරඹපිටකට්ටිය හෙවත් බෙලිගලේගොඩ සහ තඹගොඩකන්ද සහ හැව්ලොක් එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. වික්‍රමගේ විසින් මැන සකස් කරන ලද 2006 අප්‍රේල් මස 20 දිනැති අංක 2649 දරන පිඹුරේ ලොට් 02 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : ටීපී 353406, ටීපී 195591, මු.පි. 18573 හි ලොට් 3, ලොට් 1 සහ ටීපී 288857 ද, නැගෙනහිරට : ටී පී 288857 ආර්. තෙවරප්පෙරුම හිමිකම් කියන ඉඩම මු.පි. 18573 හි ලොට් 10 ටී.පී 123383 සහ බී. තෙවරප්පෙරුම හිමිකම් කියන ඉඩම ද, දකුණට : බී. තෙවරප්පෙරුම, සී. පී. ත්‍රිමාන්න සහ කේ. එම්. ඩී. ඇක්මන් හිමිකම් කියන ඉඩම් ද, සහ බස්නාහිරට : සී. පී. ත්‍රිමාන්න සහ කේ. එම්. ඩී. ඇක්මන් හිමිකම් කියන ඉඩම් ද, මු. පි. 18573 හි ලොට් 5, ටී. පී. 353406, ටී. පී. 195591 මු. පි. 18573 හි ලොට් 3 සහ ලොට් 1 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර විසි හතරයි රූඩ් එකයි පර්චස් තිස් අටක් (අ. 24, රූ. 1, පර්. 38) ක් විශාල ඉඩම සහ එහි ගොඩනැගිලි සහ සියලු දේ ද සමග වේ.

   එකී අංක 2649 දරන පිඹුරේ ලොට් 2, පහත විස්තර කර ඇති අංක 951/එල්ආර්සී/ක/167 දරන පිඹුරේ ලොට් 2හි නැවත මැනීමකි.

   ඉහත කී උඩවෙල පිහිටි රිලවලතැන්න, ඇල්ලවත්ත, ගොඩඅරඹපිටකට්ටිය හෙවත් බෙලිගලේගොඩ සහ තඹගොඩකන්ද සහ හැව්ලොක් එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට මතුගම බලයලත් මිනින්දෝරු එන්. කුලරත්න විසින් මැන සකස් කරන ලද 1983 සැප්තැම්බර් මස 16 සිට දෙසැම්බර් මස 23 දිනැති අංක 951/එල්ආර්සී/ක/167 දරන පිඹුරේ ලොට් 02 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම්කැබැල්ලට මායිම් උතුරට : එම්. ඒ. එදෝනිස් සහ තවත් අය හිමිකම් කියන පොල්හේන, බී. වී, ලුසිනෝනා හිමිකම් කියන කනත්තකොටුවපිටකට්ටිය එම්. ඒ. අගෝස් සිංඤෝ හිමිකම් කියන කන්දකොටුව (ටී. පී. 353406, 195591 සහ මු. පි. 18573 හි ලොට් 3 සහ මෙම පිඹුරේ ලොට් 1) ද, නැගෙනහිරට : ආර්. සාදික් සවුරි හිමිකම් කියන ගිරිකොලවත්ත, ආර්. තෙවරප්පෙරුම හිමිකම් කියන බෙලිගහගොඩ සහ රජයේ ඉඩම (ටී.පී. 288857, මු. පි. 18573 හි ලොට් 10, ටී.පී. 123383) ද, දකුණට : බී. තෙවරප්පෙරුම හිමිකම් කියන බෙලිගලේගොඩ, සී. පී. ත්‍රිමාන්න සහ කේ. එම්. ඩී. ඇක්මන් හිමිකම් කියන ගොඩඅරඹ ද සහ බස්නාහිරට : බෙලිගලේගොඩ, රජයේ ඉඩම මු. පි. 18573 හි ලොට් 5 සහ පාර ද වශයෙන්

මායිම් වූ එකී අංක 951/එල්ආර්සී/ක/167 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර විසි හතරයි රූඩ් එකයි පර්චස් තිස් අටක් (අ. 24, රූ. 1, පර්. 38) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේද සමඟ වේ. මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 241/27 හි ලියාපදිංචි වී ඇත.

*දේපලට පිවිසීම.-* මතුගම නගරයේ සිට අගලවත්ත පාරේ කි.මී. 3.5 ක් පමණ දෙල්ගස්හන්දිය දක්වා පැමිණ වමට හැරී දෙල්ග ස්හන්දිය - උඩවෙල පාරේ කි. මී. 2.6 ක් පමණ ගමන් ගෙන දකුණට හැරී උඩවෙල - අගලවත්ත පොඩිහන්දිය පාරට පිවිස එම පාරේ මීටර් 100 ක් පමණ ගමන් ගෙන වමට හැරී ගිරිකුල පාරට ඇතුළුවී මීටර් 800 ක් පමණ ගිය පසු අදාල දේපල මෙම පාරේ දකුණු පසින් පිහිටා තිබේ.

බී. ජේ. ෆිලානි ද සිල්වා,
අධිකරණ,
රෙජිස්ට්‍රාර් /නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු (මුළු දිවයිනටම).

වාණිජ මහාධිකරණය, කොළඹ 12,
2019 ක් වූ ජුනි මස 13 වන දින දී ය.

06-846

---

# විවිධ දැන්වීම්

## කොළඹ දී පැවැත්වෙන (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය)

| | | |
|---|---|---|
| නඩු අංකය | : | එච්. සී. (සිවිල්)/07/19/CO. |
| ස්වභාවය | : | ඈවර කිරීම |
| වටිනාකම | : | රු. 27,087,227 |
| පටිපාටිය | : | ලඝු |

රාජගිරිය නාවල පාර, අංක 593/1/1 හි ෆයින් ෆර්නිචර් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් වූ ඉල්ලීමකි. සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය මගින් ඈවර කිරීම සඳහා වූ ඉල්ලීමකි.

එල්. ඕ. එල්. සී. ෆයිනෑන්ස් පීඑල්සී
ලියාපදිංචි කාර්යාලය, අංක 100/1,
ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

.............................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් වාණිජ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 100/1, යන ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි එල්. ඕ. එල්. සී. ෆයිනෑන්ස් පීඑල්සී සමාගම විසින් වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 25 වන දින වානිජ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 09 වන දින අධිකරණය ඉදිරියේ විභාග කිරීමට විධාන කෙරුණ බවත්, එම පෙත්සමට අදාල නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැලකර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණය හිමියන් හෝ සහදායකයෙක් වේ නම් ඒ සඳහා තමා ම හෝ සිය නීති උපදේශකවරයා හෝ නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේදී පෙනී සිටිය හැකි බවත්, එකී පෙත්සමේ පිටපතක් ලබාගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

*අත්සන් කළේ* :- නුවන් ජයසිංහ,
අංක 22, ෂේඩ් ග්‍රෝව් ඇවනියු,
කොළඹ 08.

*සටහන.-* එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතොත් එසේ කිරීමට තමා අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් නුවන් ජයසිංහ වෙත ගෙනැවිත් භාර දිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනය හෝ ව්‍යාපාරික ආයතනයක් නම්, එම ව්‍යාපාරික ආයතනයේ නම හා ලිපිනය ද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ හෝ නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ 2019 ක් වූ අගෝස්තු මස 08 වන දින පස්වරු 6.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනැවිත් භාර දිය යුතුය. නැතහොත් එපරිදි තැපෑලෙන් එවිය යුතුය.

නුවන් ජයසිංහ,
අංක 22, ෂේඩ් ග්‍රෝව් ඇවනියු,
කොළඹ 08.

06-697

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.